# UNIVERSITY OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
## CENTER FOR DISTANCE & CONTINUING EDUCATION
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පරීක්ෂණය - 2015

(2016 අගෝස්තු)

<u>ඉතිහාසය VII – (HG 7)</u>

පොදුරාජ්‍ය මණ්ඩලයේ ඉතිහාසය

කාලය පැය තුන (03) යි.

යටත් පිරිසෙයින් <u>එක්</u> කොටසකින් <u>එක්</u> ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න <u>හතරකට</u> පමණක් පිළිතුරු සපයන්න.

සුදුසු තන්හි ඔබේ පිළිතුරු දළ සිතියම් මගින් පහදන්න.

නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපා හරිනු ලැබේ.

මෙම ප්‍රශ්න පත්‍රයෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව දොළස (12) කි.

---

### <u>පළමු වන කොටස</u>

1. දහසය වන සියවසේ ඉංග්‍රීසින්ගේ මුහුදින් එතෙර ව්‍යාපාරයන්හි ප්‍රධාන අරමුණු කවරේද ?

2. බ්‍රිතාන්‍ය යටත්විජිත කටයුතුවලදී පළමුවන එළිසබත් රැජිනගේ කාර්යභාරයේ වැදගත්කම සාකච්ඡා කරන්න.

3. යටත්විජිතයන්හි අභිලාෂය ගැන නොසැලකූ මවු රටට පමණක් වාසිදායක ක්‍රමයක් ලෙස පැරණි යටත්විජිත ක්‍රමය හැඳින්වීම කෙතෙක් දුරට නිවැරදිද?

4. ඇමරිකානු විප්ලවයේ වැදගත්කම විභාග කරන්න.

### <u>දෙවන කොටස</u>

5. 1763 සිට 1815 අතර කාලය තුළ මහා බ්‍රිතාන්‍ය හා ප්‍රංශය අතර පැවති සබඳතාවලදී යටත්විජිත සාධකය දරන වැදගත්කම විභාග කරන්න.

6. කැනඩාවේ ඉතිහාසයේ ඩර්හැම් වාර්තාව දරන වැදගත්කම සාකච්ඡා කරන්න.

7. ඔස්ට්‍රේලියානු ජනපදකරණය සම්බන්ධයෙන් එඩ්වඩ් ගිබන් වේක්ෆීල්ඩ්ගේ මෙහෙය විස්තර කරන්න.

8. බ්‍රිතාන්‍ය නිදහස් වෙළෙඳ ප්‍රතිපත්තිය එම අධිරාජ්‍ය සම්බන්ධයෙන් ඇති කළ බලපෑම සාකච්ඡා කරන්න.

## <u>තුන් වන කොටස</u>

9. 'ඩොමීනියන් මධ්‍ය වික්ටෝරියානු යුගය බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ උච්චස්ථානය සනිටුහන් කළේය.' මෙම ප්‍රකාශය සමඟ ඔබ කෙතෙක් දුරට එකඟවන්නේද? .

10. වෙස්ට්මිනිස්ටර් ප්‍රඥප්තිය බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය ඉතිහාසයේ දරන වැදගත්කම පැහැදිලි කරන්න.

11. 1900 සිට 1947 දක්වා කාලය තුළදී ඉන්දියානු ජාතිකවාදී ව්‍යාපාරයේ වර්ධනයන් පිළිවෙළින් දක්වන්න.

12. පහත දැක්වෙන මාතෘකා අතුරින් <u>දෙකක්</u> පිළිබඳව ලුහුඬු ඓතිහාසික සටහන් ලියන්න.

(අ) නාවුක නීති

(ආ) වහල් විරෝධී ව්‍යාපාරය

(ඇ) 1919 සාම සමතය

(ඈ) වින්ස්ටන් චර්චිල්